සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

Mathematics.lk

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2016


**06 ශ්‍රේණිය** | **ගණිතය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. සරල රේඛීය සංවෘත තලරූප තෝරා ඒවා යටින් ඉරි අඳින්න.




02. පහත සඳහන් සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා එය කියවන ආකාරයද ලියන්න.

57698024


Mathematics.lk

03. සුළු කරන්න.

$$\begin{array}{r} 345 \\ \times\ 40 \\ \hline \\ \hline \end{array}$$

04. ප.ව. 1.30 යන වේලාව අන්තර් ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

05. දී ඇති සංඛ්‍යා රේඛාව මත (-4) සහ (+2) නිරූපණය කරන්න.





06. බිස්කට් 3 බැගින් සිසුන් 7 දෙනෙකුට ලබා දීමට අවශ්‍ය බිස්කට් ගණන කීයද?

07. 1 ත් 10 ත් අතර ඇති සියළුම ඉරට්ට සංඛ්‍යා ලියන්න.

08. තුල්‍ය භාග පිළිබඳ දැනුම භාවිතා කර හිස් කොටු සම්පූර්ණ කරන්න.

$$\frac{5}{6} = \frac{15}{\square} = \frac{\square}{30}$$

09. රවුම තුල දී ඇති සමූහ පොදු ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර හිස් රවුම් තුළ ලියන්න.



10. සාධක දැනුම භාවිතයෙන් හිස්තැන් සම්පූර්ණ කරන්න.

12 x 1 = 2 x ........... = ............ x 4


11. අමල් වාර පරීක්ෂණයේදී ගණිතය විෂයය සඳහා ලබාගත් ලකුණු ආසන්න 10 ට වැටයූ විට 70 වේ. අමල් ලබාගත් ලකුණු සඳහා විය හැකි අවම ලකුණත්, උපරිම ලකුණත් ලියන්න.

12. රොම්බසය සහ සමචතුරස්‍රය යන තල රූප දෙකෙහි සමාන ලක්ෂණයක් සහ අසමාන ලක්ෂණයක් ලියන්න.


i. සමාන ලක්ෂණය : ..........................................................................................................

ii. අසමාන ලක්ෂණය : ......................................................................................................

13. ගණක රාමුවෙහි දක්වා ඇති සංඛ්‍යාව ලියන්න.





14. දී ඇති රූපයෙන් ¼ ක් අඳුරු කරන්න.



15. පහත දී ඇති සංඛ්‍යා අතරින් සංයුක්ත සංඛ්‍යා තෝරා රවුම් කරන්න.

11 12 13 14 15 16

16. මෙහි දැක්වෙන තිත් රටාව අනුව ඊළඟ තිත් රටාව ඇඳ දක්වන්න.




Mathematics.lk

17. පහත සඳහන් හිස්තැන් සම්පූර්ණ කරන්න.


1050 m = ................ km ............. m

18. දී ඇති මිනුම් අනුව ත්‍රිකෝණයේ පරිමිතිය ගණනය කරන්න.





19. පළතුරු යුෂ 800 ml කට ජලය 3l 600 ml ක් මිශ්‍ර කර සෑදිය හැකි බීම ප්‍රමාණය සොයා, එය ලීටර් හා මිලි ලීටර්වලින් දක්වන්න.

20. රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රය තුළ සරල රේඛා එකක් හෝ දෙකක් පමණක් ඇඳ ත්‍රපීසියමක රූපයක් ලබා ගන්න. එම ත්‍රපීසියම අඳුරු කර දක්වන්න.




- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

01. ඇගයීමක් සඳහා පන්ති කාමරයේදී ඔබ සකස් කළ ඝණවස්තු පිළිබඳව සිහියට නගන්න. එහිදී ඔබ භාවිත කල පතරොම් දෙකක් රූපයේ දැක්වේ.



I පතරොම



II පතරොම

(i) I හා II පතරොම භාවිත කර ඔබ සාදන ලද ඝන වස්තු 2 නම් කර පිළිවෙලින් ලියන්න. (ල. 2)

(ii) එම ඝන වස්තු දෙකෙහි මුහුණත් වල හැඩ ඇඳ එම හැඩ සඳහා දිය හැකි සුවිශේෂි නම් ලියන්න. (ල. 4)

(iii) I පතරොමෙන් සකස් කළ ඝන වස්තුවෙහි දාර, ශීර්ෂ, මුහුණත් ගණන පිළිවෙලින් ලියන්න. (ල. 3)

(iv) ඔබ සෑදූ වෙනත් ඝනවස්තුවක නම ලියා එම ඝන වස්තුව වැනි පරිසරයේ දක්නට ලැබෙන ඝන වස්තු දෙකක නම් ලියන්න. (ල. 3)

(v) II පතරොමෙන් සෑදූ ඝන වස්තුව සෑදීම සඳහා සුදුසු වෙනත් පතරොමක් අඳින්න. (ල. 2)

(vi) මෙම ඝන වස්තු සකස් කිරීමේදී ඔබට ලැබුණු අත්දැකීම් දෙකක් ලියන්න. (ල. 2)

02. (a) $>$, $<$ හෝ $=$ සංකේත යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) $\frac{5}{6}$ ............ $\frac{4}{6}$ (ii) $\frac{5}{7}$ ............ $\frac{10}{14}$ (ල. 2)

(iii) පහත සඳහන් භාග ආරෝහණ පිළිවෙලට ලියන්න. (ල. 2)

$\frac{4}{5}, \frac{4}{10}, \frac{4}{7}, \frac{4}{8}$

(b) සුළු කරන්න.


(i) $\frac{3}{7} + \frac{2}{7}$ (ල. 1) (ii) $\frac{2}{3} + \frac{1}{12}$ (ල. 3) (iii) $\frac{22}{35} - \frac{3}{7}$ (ල. 3)

Mathematics.lk

03. (a) (i) වම්බටු, මුකුණුවැන්න, රාබු, කැරට්, ගොටුකොළ, වට්ටක්කා, තක්කාලි, කැකිරි, නිවිති, අර්තාපල්, බතල යන ද්‍රව්‍ය සමූහය සඳහා සුදුසු පොදු නමක් ලියන්න. (ල. 1)


(ii) පොදු ලක්ෂණයක් අනුව ඉහත ද්‍රව්‍ය කාණ්ඩ 3 කට වෙන්කර නැවත ලියා එම කාණ්ඩ තුන සඳහා සුදුසු නම් ඒ එක එකක් ඉදිරියෙන් ලියන්න. (ල. 6)

(b) A, B හා C යනු භාජන තුනකි. ඒවා සම්පූර්ණයෙන් පිරවීමට අවශ්‍ය ජල ප්‍රමාණ රූපයේ දක්වා ඇත.




(i) A භාජනය සම්පූර්ණයෙන් පිරවීමට C භාජනයෙන් කී වාරයක් ජලය දැමිය යුතුද? (ල. 2)

(ii) A භාජනය ජලයෙන් පුරවා එම ජලයෙන් B භාජනය සම්පූර්ණයෙන් පිරවූ පසු A භාජනයේ ඉතිරිවන ජල ප්‍රමාණය කොපමණද? (ල. 2)

04. (a)  රූපයේ අඳුරු කර ඇති කොටස.

(i) භාගයක් ලෙස ලියන්න. (ල. 1) (ii) දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. (ල. 1)

(iii) ඉහත (ii) හි සංඛ්‍යාව වචනයෙන් ලියන්න. (ල. 1)

(b) (i) පහත වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න. (ල. 4)

| සංඛ්‍යාව | ඉලක්කම | ඉලක්කම පිහිටි ස්ථානය | ඉන් නිරූපණය වන අගය |
|---|---|---|---|
| 14.63 | 6 | පළමු දශමස්ථානය | 0.6 |
| 235.48 | 3 | දහයස්ථානය | .......... |
| 316.52 | 2 | ............................ | 0.02 |
| 75.07 | 0 | ............................ | .......... |

(ii) වගුව පිටපත් කරගෙන එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

| + | 5.94 |
|---|---|
| 12.7 | .................. |
| 18.96 | .................. |

(ල. 2)

(iii)
$$\begin{array}{r} 25.72 \\ -\ 13.67 \\ \hline \end{array}$$
(ල. 2)

05.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |

ඉහත කාඩ්පත් වල දී ඇති සංඛ්‍යා ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙහි ඇති ත්‍රිකෝණ සංඛ්‍යා සියල්ල ලියන්න. (ල. 2)

(ii) ප්‍රථමක සංඛ්‍යා දෙකක් ලියන්න. (ල. 2)

(iii) සමචතුරස්‍ර සංඛ්‍යාවකුත් වන සංයුක්ත සංඛ්‍යාවකුත් වන සංඛ්‍යා දෙකක් ලියන්න. (ල. 2)

(iv) ත්‍රිකෝණ සංඛ්‍යා රටාව ඇසුරින් සමචතුරස්‍ර සංඛ්‍යා රටාව ලබාගත හැකි බව කසුන් පවසයි. ඔහුගේ ප්‍රකාශය සත්‍ය බව පැහැදිලි කරන්න. (ල. 3)

(v) මෙම කාඩ්පත්වල ඇති සංඛ්‍යා වල සෑම අනුයාත සංඛ්‍යා දෙකකටම ඓක්‍යයෙන් ලැබෙන සංඛ්‍යා රටාව ලියා, එම සංඛ්‍යා කුමන සංඛ්‍යා රටාවට අයත්දැයි ලියන්න. (ල. 2)

06. (i) දී ඇති වගුව පිටපත්කරගෙන එක් එක් අවස්ථාවල දිග මැනීම සඳහා සුදුසු උපකරණය හා ඒකකය හිස්තැන් වල ලියන්න.


| අවස්ථාව | සුදුසු උපකරණය | ඒකකය |
|---|---|---|
| බිත්තියක උස | මීටර් කෝදුව | මීටර් |
| අභ්‍යාස පොතේ ඝණකම | .................................... | ................ |
| ගසක වට ප්‍රමාණය | .................................... | ................ |

(ල. 4)

Mathematics.lk


(ii) පහත රූපවල පරිමිතිය සොයන්න. (ල. 2)

(a)




(ල. 2)

(b)




(ල. 2)

(iii) ඍජුකෝණාස්‍රාකාර පින්තූරයක පළල 20 cm ක් ද පරිමිතිය 100 cm ද නම් එහි දිග සොයන්න.

(ල. 3)

07. (i) පහත සඳහන් සංඛ්‍යාවල සාධක 4 බැගින් ලියන්න. (ල. 4)

32 -        60 -

(ii) 20 ට වඩා විශාල 4 හි ගුණාකාර 4 ක් ලියන්න. (ල. 2)





(iii) පහත සඳහන් සංඛ්‍යා අතරින් ඉතිරි නැතිව 5 න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න. (ල. 2)

235, 346, 558, 390

(iv) පන්තියක සිසුන් 50 දෙනෙක් සිටිති. එක් කණ්ඩායමකට සිසුන් දෙදෙනෙකුට වඩා සිටින සේ ද, සෑම කණ්ඩායමකම සමාන සිසුන් ගණනක් සිටින සේ ද සිසුන් 50 දෙනාම කණ්ඩායම් කළ විට එක් කණ්ඩායමක සිටිය හැකි සිසුන් සංඛ්‍යා සියල්ල ලියන්න. (ල. 3)




## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | $a$, d | 1+1 | 02 |
| 02. | 57 698 024 | 01 | |
| | පනස්හත් මිලියන හයසිය අනූඅට දහස් විසි හතර | 01 | 02 |
| 03. | 13800 | 02 | 02 |
| 04. | 13:30 | 02 | 02 |
| 05. |  | 1+1 | 02 |
| 06. | 21 | 02 | 02 |
| 07. | 2, 4, 6, 8 | | |
| | 3 ක් හෝ 4 ම නිවැරදිනම් | 02 | |
| | 1 ක් හෝ 2 ක් නිවැරදිනම් 01 | | 02 |
| 08. | $\frac{15}{\boxed{18}} = \frac{\boxed{25}}{30}$ | 1+1 | 02 |
| 09. |  | 1+1 | 02 |
| 10. | 2 x <u>6</u> = <u>3</u> x 4 | 1+1 | 02 |
| 11. | 65 හා 74 | 1+1 | 02 |
| 12. | සමාන - පාද 4 ම දිගින් සමාන වීම. | 01 | |
| | අසමාන - සමචතුරස්‍රයේ කෝණ සෘජුකෝණ වන අතර රොම්බසයේ එසේ නොවේ. | 01 | 02 |
| | (ගැලපෙන පිළිතුරකට ලකුණු දෙන්න.) | | |
| 13. | 21.13 | 02 | 02 |
| 14. | රූපයේ කොටු 2 ක් අඳුරු කිරීමට | 02 | 02 |
| 15. | 11, (12), 13, (14), (15), (16) | | |
| | 3 ක් හෝ 4 ම නිවැරදි නම් | 02 | |
| | 1 ක් හෝ 2 ක් නිවැරදි නම් - 01 | | 02 |
| 16. |  | 02 | 02 |
| 17. | 1 km 50 m | 1+1 | 02 |
| 18. | 19 cm හෝ 190 mm | 02 | 02 |
| 19. | 4 $l$ 400 $ml$ | 1+1 | 02 |
| 20. |  | 02 | 02 |
| | | | **40** |

Mathematics.lk

### II කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. | (i) | ඝනකය | 1 | |
| | | චතුස්තලය | 1 | 02 |
| | (ii) |  සමචතුරස්‍රය | 02 | |
| | |  සමපාද ත්‍රිකෝණය | 02 | 04 |
| | (iii) | 12 | 1 | |
| | | 8 | 1 | |
| | | 6 | 1 | 03 |
| | (iv) | සුදුසු පිළිතුරකට | | 03 |
| | (v) |  | | 02 |
| | (vi) | සුදුසු පිළිතුරකට | | 02 |
| | | | | **16** |
| 02 | (a) (i) | $\frac{5}{6} \underset{.....}{>} \frac{4}{6}$ | 01 | 01 |
| | (ii) | $\frac{5}{7} \underset{.....}{=} \frac{10}{14}$ | 01 | 01 |
| | (iii) | $\frac{4}{10}, \frac{4}{8}, \frac{4}{7}, \frac{4}{5}$ | 02 | 02 |
| | (b) (i) | $\frac{5}{7}$ | 01 | 01 |
| | (ii) | $\frac{8}{12} + \frac{1}{12}$ | 01 | |
| | | $= \frac{9}{12}$ | 01 | |
| | | $= \frac{3}{4}$ | 01 | 03 |
| | (iii) | $\frac{22}{35} - \frac{15}{35}$ | 01 | |
| | | $= \frac{7}{35}$ | 01 | |
| | | $= \frac{1}{5}$ | 01 | 03 |
| | | | | **11** |

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 03 | (a) (i) සුදුසු පිළිතුරකට | 01 | 01 |
| | (ii) වම්බටු, වට්ටක්කා, තක්කාලි, කැකිරි, රාබු, කැරට් | 01 | |
| | - එළවළු | 01 | |
| | මුකුණුවැන්න, ගොටුකොළ, නිවිති | 01 | |
| | - පලාවර්ග | 01 | |
| | අර්තාපල්, බතල | 01 | |
| | - අල වර්ග | 01 | 06 |
| | (b) (i) 8 | 02 | 02 |
| | (ii) 1*l* 250 *ml* | 02 | |
| | 2 *l* - 750 m*l* | 01 | 02 |
| | | | **11** |
| 04 | (a) (i) $\frac{4}{10}$ | 01 | |
| | (ii) 0.4 | 01 | |
| | (iii) බින්දුවයි දශම හතර | 01 | 03 |
| | (b) (i) 30 | 01 | |
| | දෙවන දශමස්ථානය | 01 | |
| | පළමුවන දශමස්ථානය | 01 | |
| | 0.0 හෝ 0 | 01 | 04 |
| | (ii) | | |
| | 18.64 | 01 | |
| | 24.90 | 01 | 02 |
| | (iii) 12.05 | 02 | 02 |
| | | | **11** |
| 05 | (i) 1, 3, 6, 10 | | |
| | සංඛ්‍යා 3 ක් හෝ 4 ම | | |
| | සංඛ්‍යා 2 කට | 1 | 02 |
| | (ii) 2, 3, 5, 7 යන සංඛ්‍යාවලින් 2 ක් | | 02 |
| | (iii) 4, 9 | | 02 |
| | (iv) සුදුසු පිළිතුරකට | | 03 |
| | (v) 3, 5, 7, 11, 13 ..... | | |
| | ඔත්තේ සංඛ්‍යා රටාවට | | 02 |
| | | | **11** |
| 06 | (i) අඩිරූල mm | 02 | |
| | මිනුම්පටිය cm | 02 | 04 |
| | (ii) (a) 6cm + 4cm + 3cm + 5cm | 01 | |
| | 18 cm | 01 | 02 |
| | (b) 8cm + 2cm + 6cm + 4cm + 2cm + 6 cm | 01 | |
| | 28 cm | 01 | 02 |
| | (iii) 40 ලබාගැනීම | 01 | |
| | 100 - 40 = 60 cm | 01 | |
| | $\frac{60}{2}$ = 30 cm | 01 | 03 |
| | | | **11** |
| 07 | (i) 32 - 1, 2, 4, 8, 16, 32 | | |
| | 4 ම නිවැරදි නම් | 02 | |
| | 60 - 1, 2, 3, 4, 5, 10, 12, 15 30, 60 | | |
| | 4 ම නිවැරදි නම් | 02 | 04 |
| | (ii) නිවැරදි ගුණාකාර 4 කට | 02 | 02 |
| | (iii) 235, 390 | 02 | 02 |
| | (iv) 5, 10, 25 ....... 1 + 1 + 1 | | 03 |
| | | | **11** |

Mathematics.lk